## මතක තබා ගන්න

- අවයව ලබා ගැනීම සිදු කරනු ලබන්නේ මියගිය බවට පළපුරුදු වෛද්‍ය කණ්ඩායමක් විසින් තහවුරු කල පසුව පමණි.
- අවයව ඉවත් කරගැනීම දේහයට කිසිදු ආකාරයක විකෘති වීමක් සිදු නොවන පරිදි පලපුරුදු විශේෂඥය ශල්‍ය වෛද්‍ය කණ්ඩායමක් විසින් ශල්‍යාගාරයක් තුල සිදු කරනු ලැබේ.
- මොළය මියගොස් ඇති නිසා ශල්‍යකර්මයේදී ඔහුට කිසිදු වේදනාවක් නොදැනේ.
- දේහය කිසිදු අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ඥාතීන්ට ලබා දීමට කටයුතු කෙරෙනු ඇත.



## අවයව දන්දිය හැක්කේ කෙසේද?

- අවයව දන් දීම සඳහා අදම ලියාපදිංචි වන්න.
- ඔබේ තීරණය පවුලේ අයට දැනුම් දෙන්න.
- ඔබේ තීරණය වෙනස් වුවහොත් ඔබට කැමති වෙලාවක මෙයින් ඉවත් විය හැක.
- ලියාපදිංචි වීම සදහා පහත සදහන් ලිපිනයට අයදුම්පත් යොමු කරන්න

**අවයව බද්ධ කිරීමේ ඒකකය**
**ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල**
**තලපත්පිටිය**
**නුගේගොඩ**

# ජීවිතයෙන් ජීවිතයක්






**තවකෙකුට දියහැකි**
**උතුම්ම ත්‍යාගය ජීවිතයයි**

**වැඩි විස්තර සඳහා**
https://www.facebook.com/OrganDonorDaySL/
outsjgh@gmail.com
sjghsrilanka.com/otu

අවයව බද්ධ කිරීමේ ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

## අකාලයේ අපට ජීවිතයෙන් සමුගැනීමට සිදුවුවහොත්, ජීවිතයේ අවසානය කරා ලඟා වූ රෝගීන් 08 දෙනෙකුට නව බලාපොරොත්තුවක් වීමට අවස්ථාවයි මේ...

- ජීවිතයේ අවසානය කරා ලඟා වූ තවත් 08 දෙනෙකුට නව බලාපොරොත්තුවක් වීමට ඔබට හැකිය.
- අවයව අකර්මන්‍ය වීම නිසා රෝගීන් දහස් ගණනක් අකාලයේ මිය යයි.
- මින් බහුතරයක් රෝගීන්ගේ ජීවිත බේරා ගත හැක්කේ සුදුසු අවයවයක් බද්ධ කිරීමෙන් පමණි.
- අවයව දන් දීම මගින් එවැනි රෝගියෙකුගේ ජීවිතයකට එළියක් වීමට ඔබට හැකිය.
- එසේ තිබියදී මරණයෙන් පසුව ඔබගේ අවයව පොළවට වැළලී යාමට ඉඩ දිය යුතුද?



## 'මොළය මියයාම' යනු කුමක්ද?



- මෙය මොළයට සිදුවන දරුණු අනතුරක් නිසා මොළයේ ක්‍රියාකාරීත්වය සම්පූර්ණයෙන්ම නතරවන තත්වයකි. මෙය යථා තත්වයට පත්කළ නොහැකිය.
- එනම් රෝගියා මියගොස් ඇත.
- මෙවැනි අවස්ථාවක යන්ත්‍රයක් ආධාරයෙන් කෘත්‍රිම ස්වසනය ලබා දීමෙන් රුධිරයේ ඔක්සිජන් මට්ටම පවත්වා පවත්වා ගතහැකි අතර එමගින් අනෙකුත් පද්ධති/අවයව වල ක්‍රියාකාරීත්වය පැය කීපයකට පමණක් පවත්වා ගත හැක.
- මෙම අවස්ථාවේදී මෙම රෝගියාගේ අවයව ලබාගෙන වෙනත් රෝගියෙකුට බද්ධ කිරීමේ හැකියාව පවතී.

## දන් දියහැකි හැකි අවයව/පටක මොනවාද?

- එසේ ලබාගත හැකි අවයව වන්නේ
  - හදවත
  - වකුගඩු
  - පෙනහළු
  - අග්න්‍යාශය
  - අක්මාව
  - අන්ත්‍ර/බඩවැල්
- මීට අමතරව ඇස්, අස්ථි සහ බණ්ඩරා වැනි පටක දන් දීමෙන් රෝගීන් 50 කට අධික ප්‍රමාණයකගේ ජීවිත ආලෝකමත් කළ හැක.




## අවයව දන් දිය හැක්කේ කාටද?

- මොළය මියයාමට ලක්වූ ඕනෑම කෙනෙක්ට මෙලෙස සියලුම හෝ සුදුසු අවයවයන් දන් දිය හැක.